**වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය**

# ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

**තේ පර්යේෂණ මණ්ඩලය**

# අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරි තනතුර

තලවකැලේ, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ඉහත තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**රැකියා විස්තරය :**

ආයතනයේ සියලුම පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් සහ පරිපාලන හා මූල්‍යමය කටයුතු සඳහා වගකීම හා ආයතනයේ කාර්ය මණ්ඩලයට නායකත්වය හා අනුබලය ලබාදීම.

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර :**

පිළිගත් විශ්වවිද්‍යාලයකින්, විද්‍යාව / කෘෂිකර්මය හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ වසර හතරක (04) විශේෂ උපාධියක් පළමු හෝ දෙවන පන්තියේ ඉහළ පෙළ පන්ති සාමාර්ථයන් සහිතව සහ අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය (PhD) උපාධියක් ලබා තිබීම.

සහ

පිළිගත් ආයතනයක අවම වශයෙන් වසර විස්සක (20) කළමනාකරණ මට්ටමේ පර්යේෂණ පළපුරුද්ද සහ කළමනාකරණ පළපුරුද්ද, ඉන් වසර දොළහක් (12) ආචාර්ය (PhD) උපාධිය ලබා ගැනීමෙන් පසුව හා වසර පහක් (05) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතු අතර, ප්‍රත්‍යක්ෂ වූ සේවා වාර්තාවක් සහිත විය යුතුය.

සහ

පර්යේෂණ විද්‍යාඥයින් / ව්‍යාප්තිකාරකයින්ගෙන් සමන්විත බහු ශික්ෂණ කණ්ඩායම් ඉදිරියට ගෙන යමින් මෙහෙයවීමෙහිලා සනාථ කළ හැකියාව. මානව හා අනෙකුත් සම්පත් නිසියාකාරව පෙලගස්වමින් කාර්යක්ෂමව කළමනාකරණය කිරීමේ පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ.

**අභ්‍යන්තර :**

පිළිගත් විශ්වවිද්‍යාලයකින්, විද්‍යාව / කෘෂිකර්මය හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ වසර හතරක (04) විශේෂ උපාධියක් දෙවන පෙළ පන්ති සාමාර්ථයන් සහිතව සහ අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය (PhD) උපාධියක් ලබා තිබීම සහ තේ පර්යේෂණ ආයතනයේ අතිරේක අධ්‍යක්ෂ ලෙස වසර තුනක (03) සතුටුදායක සේවාවක් හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ හා ව්‍යාප්ති ලෙස වසර පහක (05). සතුටුදායක සේවාවක් හෝ අංශ ප්‍රධානී / ප්‍රධාන පර්යේෂණ නිලධාරී / ප්‍රධාන උපදේශක නිලධාරී ලෙස වසර අටක (8) සතුටුදායක සේවාවක්

හෝ

විද්‍යාව / කෘෂිකර්මය හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් සමඟ වසර දෙකක (02) පශ්චාත් පර්යේෂණ උපාධියක් සහ අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය (PhD) උපාධිය සමඟ තේ පර්යේෂණ ආයතනයේ අතිරේක අධ්‍යක්ෂ ලෙස වසර තුනක (03) සතුටුදායක සේවාවක් හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ / ව්‍යාප්ති ලෙස වසර පහක (05) සතුටුදායක සේවාවක් හෝ අංශ ප්‍රධානී / ප්‍රධාන පර්යේෂණ නිලධාරී / ප්‍රධාන උපදේශක නිලධාරී ලෙස වසර අටක (08) සතුටුදායක සේවාවක්

සහ

පර්යේෂණ විද්‍යාඥයින් / ව්‍යාප්ති විද්‍යාඥයින් සහිත බහු ශික්ෂණ කණ්ඩායම් ඉදිරියට ගෙන යමින් මෙහෙය වීමෙහිලා සනාථ කළ හැකියාව. මානව සම්පත් හා අනෙකුත් සම්පත් නිසියාකාරව පෙළ ගස්වමින් කාර්යක්ෂමව කළමනාකරණය කිරීමේ පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ.

වැටුප් පරිමාණය : HM 2-3(2016) රු. 98,215-12X2,700-රු. 130,615 මාසිකව

වයස : අවුරුදු 40 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

**තෝරා ගැනීමේ ක්‍රමය** : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි,

**වෙනත් වරප්‍රසාද :**

i. තලවකැලේ තේ පර්යේෂණ ආයතනයේ සම්පූර්ණ ගෘහ භාණ්ඩ සහිත නිල නිවාසයක් ලබා දෙනු ඇත.

ii. ආයතනයේ පවත්නා වෛද්‍ය යෝජනාක්‍රමයට අනුව වෛද්‍ය ප්‍රතිලාභ හිමිවේ.

iii. අර්ථසාධක අරමුදල : තෝරා ගනු ලබන අයදුම්කරු තම වැටුපෙන් 10% කින් දායක විය යුතු අතර, ආයතනය 15% කින් දායක වනු ඇත. ආයතනය සේවක භාරකාර අරමුදලට 3% කින්ද දායක වනු ඇත.

iv. ගෘහස්ථ කම්කරු ඒකක හතරක් (අභ්‍යන්තර දෙදෙනෙක් සහ බාහිර දෙදෙනෙක් වශයෙන්)

v. පත්වීම ලබාගන්නාගේ මනාපය මත, පවත්නා රජයේ රෙගුලාසිවලට අනුකූලව සීමිත පෞද්ගලික භාවිතය සඳහා වාහනයක්.

vi. තනතුරට අදාළ වෙනත් අමතර ප්‍රතිලාභ.

තනතුර ස්ථිරය. තම සියලු ජීවදත්ත ඇතුළත් අයදුම්පත් උප්පැන්න සහතිකයේ සහ අදාළ අධ්‍යාපන හා වෙනත් වෘත්තීය සුදුසුකම්, සේවා සහතිකවල පිටපත් අයදුම්කරුගේ නිපුණතා හා අදාළ ක්ෂේත්‍රයේ දැනුම තක්සේරු කළ හැකි ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනකුගේ නම් හා ලිපිනයන්ද සමග **2023 ජනවාරි 24 වන දින** හෝ ඊට පෙර පහත අත්සන් කරන අය වෙත ලියාපදිංචි තැපැල මගින් ලැබෙන්නට සැලැස්විය යුතුය.

රාජ්‍ය සේවයේ / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වුවත් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. මෙම අවශ්‍යතාවයට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. ලිපි කවරයේ වම් ඉහළ කෙළවරේ 'අයදුම් කරන තනතුර' සඳහන් කරන්න. වැඩිමනත් තොරතුරු සඳහා තේ පර්යේෂණ ආයතනයේ www.tri.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

**සභාපති,**
**තේ පර්යේෂණ මණ්ඩලය,**
**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය,**
**ශාන්ත කූම්බ්ස්, තලවකැලේ.**